ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2016/05/26 |

## 2016 අප්‍රේල් මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.ද.) (2013=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2016 මාර්තු මාසයේ දී වාර්තා කළ සියයට 2.2 හි සිට 2016 අප්‍රේල් මාසයේ දී සියයට 4.3 දක්වා ඉහළ ගියේය. ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග; මධ්‍යසාර පාන හා දුම්කොළ; රෙදිපිළි හා පාවහන්; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු; සෞඛ්‍ය; ප්‍රවාහන; විනෝදාත්මක හා සංස්කෘතික; අධ්‍යාපන; ආපනශාලා හා හෝටල් සහ විවිධ භාණ්ඩ හා සේවා උප කාණ්ඩ 2016 අප්‍රේල් මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය සඳහා බලපා ඇත.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි වෙනස 2016 මාර්තු මස වාර්තා වූ සියයට 2.4 හි සිට 2016 අප්‍රේල් මස දී සියයට 2.6 දක්වා ඉහළ ගියේය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සැලකූ විට 2016 මාර්තු මාසයේ දර්ශක අංක 111.0 සිට අප්‍රේල් මාසයේ දර්ශක අංක 111.6 දක්වා සියයට 1.5 ක වැඩිවීමක් වාර්තා වේ. මෙම වැඩිවීම සඳහා ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් කාණ්ඩයේ අයිතමයන්හි මිල ගණන් ප්‍රධාන වශයෙන් දායක විය. අළුත් මාළු, ලූණු, සහල්, සමහර පළතුරු වර්ග, අර්තාපල්, සීනි, කුකුළු මස්, පාන් මිල ගණන් මෙම මාසය තුළ දී ඉහළ ගියේය. මධ්‍යසාර පාන හා දුම්කොළ; රෙදිපිළි හා පාවහන්; නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු; ප්‍රවාහන; ආපනශාලා හා හෝටල් සහ විවිධ භාණ්ඩ හා සේවා යන උපකාණ්ඩවල මිල ගණන් අප්‍රේල් මාසය තුළ දී ඉහළ ගියේය. මේ අතර, සෞඛ්‍ය; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික

උප කාණ්ඩවල මිල ගණන් නොවෙනස්ව පැවතුණි. එකතු කළ අගය මත බදු (VAT බදු) සහ ජාතිය ගොඩනැගීමේ බදු (NBT) සංශෝධනයන් 2016 මැයි මස සිට ක්‍රියාත්මක කරන ලද බැවින් 2016 අප්‍රේල් මාසයේ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ වෙනස සඳහා එම සංශෝධනයන් සෘජු ලෙස බලපා නැත.



**ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම**
**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | මාසික % වෙනස | ලක්ෂ්‍යමය % වෙනස | වාර්ෂික සාමාන්‍ය % වෙනස |
|---|---|---|---|---|---|
| **2014** | ජනවාරි | 103.1 | | | |
| | පෙබරවාරි | 103.0 | -0.1 | | |
| | මාර්තු | 103.2 | 0.2 | | |
| | අප්‍රේල් | 104.1 | 0.9 | | |
| | මැයි | 104.9 | 0.8 | | |
| | ජූනි | 106.2 | 1.2 | | |
| | ජූලි | 107.0 | 0.8 | | |
| | අගෝස්තු | 106.4 | -0.6 | | |
| | සැප්තැම්බර් | 106.4 | 0.0 | | |
| | ඔක්තෝබර් | 106.0 | -0.4 | | |
| | නොවැම්බර් | 106.9 | 0.8 | | |
| | දෙසැම්බර් | 108.6 | 1.6 | | |
| **2015** | ජනවාරි | 112.8 | 3.9 | 9.4 | |
| | පෙබරවාරි | 108.9 | -3.5 | 5.7 | |
| | මාර්තු | 107.6 | -1.2 | 4.3 | |
| | අප්‍රේල් | 107.0 | -0.6 | 2.8 | |
| | මැයි | 108.0 | 0.9 | 3.0 | |
| | ජූනි | 109.1 | 1.0 | 2.7 | |
| | ජූලි | 108.9 | -0.2 | 1.8 | |
| | අගෝස්තු | 108.4 | -0.5 | 1.9 | |
| | සැප්තැම්බර් | 108.4 | 0.0 | 1.9 | |
| | ඔක්තෝබර් | 109.2 | 0.7 | 3.0 | |
| | නොවැම්බර් | 112.0 | 2.6 | 4.8 | |
| | දෙසැම්බර් | 113.2 | 1.1 | 4.2 | 3.8 |
| **2016** | ජනවාරි | 112.0 | -1.1 | -0.7 | 2.9 |
| | පෙබරවාරි | 110.8 | -1.1 | 1.7 | 2.6 |
| | මාර්තු | 110.0 | -0.7 | 2.2 | 2.4 |
| | අප්‍රේල් | 111.6 | 1.5 | 4.3 | 2.6 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව